ET/SSS/2022(2023)/OL/50/S/Q/S-1


අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education


G. C. E. Ordinary Level | අ. පො. ස. සාමාන්‍ය පෙළ | 2022 (2023)

## Student Seminar Series

## ශිෂ්‍ය සම්මන්ත්‍රණ මාලාව

Practice Paper | උපකාරක ප්‍රශ්න පත්‍ර

# Drama & Theatre

# නාට්‍ය හා රංග කලාව



**Question Paper - I, II | ප්‍රශ්න පත්‍රය - I, II (සිංහල මාධ්‍යය)**


මෙහෙයවීම : දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව | අන්තර්ගතය : සෞන්දර්යය අධ්‍යාපන ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
**Ministry of Education, Sri Lanka**

| 50 | S | I, II |
|---|---|---|

අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - ශිෂ්‍ය සම්මන්ත්‍රණ මාලාව - 2022 (2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை- மாணவர் கருத்தரங்கு தொடர் - 2022 (2023)
**G. C. E. Ordinary Level Examination – Student Seminar Series**

| | |
|---|---|
| නාට්‍ය හා රංග කලාව | I, II |
| நாடகமும் அரங்கியவும் | I, II |
| **Drama & Theatre** | I, II |

*පැය තුනයි.*
*மூன்று மணித்தியாலம்*
*Three Hours*

| | |
|---|---|
| අමතර කියවීම් කාලය | - මිනිත්තු 10 යි. |
| மேலதிக வாசிப்பு நேரம் | - 10 நிமிடங்கள் |
| Additional Reading Time | – 10 minutes |

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

## නාට්‍ය හා රංග කලාව (සිංහල) I

**සැලකිය යුතුයි:**

* **සියලු ම** ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
* අංක 1 සිට 40 තෙක් ප්‍රශ්න වල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.**
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X ) ලකුණ යොදන්න.**

- **පහත දැක්වෙන ගද්‍ය පාඨ ඇසුරින් අංක 1 සිට 5 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(A) a – අනේ බොලන්, මොකටද ඔච්චර කල් ඇවිද්දේ?
b - මලේ රජ්ජුරුවන් වහන්සේගේ කුඹුර පාලුකරපු හූරා සොයා ගන්න.

(B) a - නැත. මහරජාණෙනි...
b - එසේ වී නම් නියපොතු, දත්, සම්, මස්, නහර,.....ආදිය නාග සේන ද ?

(C) a – (බෙර හඬට බය වූ බව පෙන්වයි.) බසායං අත්පී.
b - බස් යන්නේ මේ පාරෙන් නෙවේ. කන්දෙන් එහා පැත්තේ.

(D) a - මොකක්ද? මොකක් ද? හුච්චි අම්මා...නොදොකිං උඹ
b - මරක්කල ආච්චියෙක් නෙවේ. ඒ විලාසේ බන්, ආ අක්කණ්ඩී.

(E) a - ඉතින්, ඉතින්?
b - ඌට කකුල් පහක් තිබුණා. අපි දැක්කම 'ජබුක්' ගාලා ගහට පැනලා 'බබුක්' ගාලා බුබුල් දාන්න පටන් ගත්තා.

01. ඉහත ගද්‍ය සංවාද අතරින් බෞද්ධ පූජාකර්මයකට අයත් වන්නේ,
1) A ය. 2) B ය. 3) C ය. 4) D ය.

02. සංඛපාල රජු සම්බන්ධ ශාන්තිකර්මයට අදාළ ගද්‍ය සංවාදය වන්නේ,
1) A ය. 2) C ය. 3) D ය. 4) E ය.

03. මැණික්පාල ශාන්තිකර්මයට අදාළ ගද්‍ය සංවාදය වන්නේ,
1) B ය. 2) C ය. 3) D ය. 4) E ය.

04. පත්තිනි දේවිය හා සම්බන්ධ ශාන්තිකර්මයට අදාළ ගද්‍ය සංවාදය වන්නේ,
1) A ය. 2) B ය. 3) D ය. 4) E ය.

05. උඩරට ශාන්තිකර්මයට අදාළ ගද්‍ය සංවාදය වන්නේ,
1) A ය. 2) B ය. 3) D ය. 4) E ය.

- **නිවැරදි පිළිතුර තෝරන්න.**

06. තම පරිකල්පන ශක්තිය මෙහෙයවා නිර්මාණය කරගන්නා චලන වන්නේ,
1) නිර්මිත චලන ය. 2) ස්වභාවික චලන ය. 3) තාලානුකූල චලන ය. 4) අභිරූපණ චලන ය.

07. "නාට්‍යය යනු ජීවිතයේ පෙත්තකි" මෙම ප්‍රකාශය කරන ලද්දේ,
1) ඇරිස්ටෝටල් ය. 2) බර්නාඩ් ෂෝ ය. 3) ශේක්ෂ්පියර් ය. 4) භරතමුනි ය.

08. රංග අභ්‍යාසයක් වන්නේ,
1) වෙද පුටුව 2) මකර වල්ගය කැඩීම 3) නායකයා සෙවීම 4) බල්ලා සහ මස් කටුව

09. ක්ෂණික නිරූපණයක ලක්ෂණයක් වන්නේ,
1) පිටපතක් සහිතව නිරූපණය කෙරේ.
2) පෙර සූදානමකින් නිරූපණය කෙරේ.
3) දෙන ලද ඉඟියකට අනුව නිරූපණය කෙරේ.
4) අවස්ථා කිහිපයක් නිරූපණය කෙරේ.

10. නෘත්‍යවලට අදාළ වන්නේ,
1) අංග වික්ෂේපයක් පමණි.
2) ලී කෙළි, කළගෙඩි, වෙස් නැටුම් උදාහරණ වේ.
3) මෙය ශුද්ධ නැටුම නම් වේ.
4) ආංගිකාභිනය හා සාත්විකාභිනය ප්‍රධාන වේ.

11. දෘශ්‍ය කලාවලට අදාළ වන්නේ,
1) චිත්‍රපට, සාහිත්‍යය, නවකතා, සංගීතය
2) චිත්‍ර, මූර්ති, කැටයම්, ප්‍රතිමා
3) සංගීතය, මූර්ති, සාහිත්‍යය, ටෙලි නාට්‍යය
4) කැටයම්, ප්‍රතිමා , නාට්‍යය, සංගීතය

12. නාට්‍ය පිටපතෙහි ඇති කතාව ප්‍රේක්ෂකයාට ප්‍රදර්ශනය වන්නේ,
1) නළුවා මගිනි.
2) රංගාලෝකය මගිනි.
3) අංගරචනය මගිනි.
4) රංග රචනය මගිනි.

13. නාට්‍යමය අවස්ථාවක් හා සම්බන්ධ වන්නේ,
1) හුදු අවස්ථා නිරූපණයක් පමණක් වේ.
2) දෙපාර්ශවයේ ම එකඟතාවක් දක්නට ලැබේ.
3) ප්‍රතිවිරුද්ධ ක්‍රියාවලීන් දෙකක් දක්නට ලැබේ.
4) සෑම අවස්ථාවක දී ම හාස්‍ය රසය ජනිත වේ.

14. ප්‍රසිද්ධ මුද්‍රා නාට්‍යයක් වන්නේ,
1) හංසවිල 2) කරදිය 3) මානසවිල 4) දෙපානෝ

15. ‘ඔබ දැන් ඇවිදින්නේ ලස්සන මල් පිපිණු මල් වත්තක ය. කුරුලු නාදය ඇසේ.” යන ගුරු විධානයට අනුව ඔබ සිදුකරන ලද රංග අභ්‍යාසය වන්නේ,

1) සිරුර උණුසුම් කරන අභ්‍යාසයකි
2) සිරුරේ නම්‍යශීලීත්වය ඇති කරන අභ්‍යාසයකි
3) පරිකල්පනය වර්ධනය කරන අභ්‍යාසයකි
4) චිත්ත ඒකාග්‍රතාව ඇති කරන අභ්‍යාසයකි

- **පහත දැක්වෙන වගුව ඇසුරින් අංක 16 සිට 20 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| මුල් කෘතිය | රචකයා | පරිවර්තන | පරිවර්තකයා |
|---|---|---|---|
| ද ෆාදර් | **A** | පීතෘ | ප්‍රේමරංජිත් තිලකරත්න |
| **B** | ප්ලෝටස් | කඹය | බන්දුල ජයවර්ධන |
| කැට් ඔන් ද හොට් ටින් රූෆ් | ටෙනිසි විලියම්ස් | හෙලේ නැග්ග ඩෝං පුතා | **C** |
| ඇන්ටිගනී | සොෆොක්ලීස් | **D** | ආරියවංශ රණවීර |
| ඇපල් කාර්ට් | **E** | ඇපල් කරත්තය | පියදාස නිශ්ශංක |

16. ඉහත වගුවේ ‘A’ කොටුවට ඇතුළත් විය යුතු රචකයාගේ නම වන්නේ,
1) හෙන්රික් ඉබ්සන් 2) බර්ටොල්ට් බ්‍රෙෂ්ට්
3) ඔගස්ට් ස්ට්‍රින්ඩ්බර්ග් 4) මැක්සිම් ගෝර්කි

17. ඉහත වගුවේ ‘B’ කොටුවට ඇතුළත් විය යුතු මුල් කෘතියේ නම වන්නේ,
1) රූඩන්ස් 2) යෙර්මා 3) එල්ඩර් සන් 4) ද ඩ්‍රැගන්

18. ඉහත වගුවේ ‘C’ කොටුවට ඇතුළත් විය යුතු පරිවර්තකයාගේ නම වන්නේ,
1) හෙන්රි ජයසේන 2) රංජිත් ධර්මකීර්ති 3) විජිත ගුණරත්න 4) සුගතපාල ද සිල්වා

19. ඉහත වගුවේ ‘D’ කොටුවට ඇතුළත් විය යුතු පරිවර්තනයේ නම වන්නේ,
1) ඊඩිපස් 2) ඇන්ටිගනී 3) වෙරිවත්ත 4) ජනහතුරා

20. ඉහත වගුවේ ‘E’ කොටුවට ඇතුළත් විය යුතු රචකයාගේ නම වන්නේ,
1) ටෙනිසි විලියම්ස් 2) සැමුවෙල් බෙකට් 3) ඇන්ටන් චෙකෝෆ් 4) බර්නාඩ් ෂෝ

- **පහත දැක්වෙන ඡායාරූප ඇසුරෙන් 21 සිට 25 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**



**(A)**



**(B)**



**(C)**



**(D)**



**(E)**

21. විකෘති නාට්‍යයේ රංගනයෙන් දායක වූයේ,
1) ‘A’ ය. 2) ‘B’ ය. 3) ‘C’ ය. 4) ‘D’ ය.

22. 'වෙසක් දැක්ම' වීදි නාට්‍යය නිර්මාණය කළේ,
1) 'B' ය. 2) 'C' ය. 3) 'D' ය. 4) 'E' ය.

23. 'සිංහබාහු' නාට්‍යයේ රංගනයෙන් දායක වූයේ,
1) 'A' ය. 2) 'C' ය. 3) 'D' ය. 4) 'E' ය.

24. 'ජනේලය' නාට්‍යය නිර්මාණය කළේ,
1) 'B' ය. 2) 'C' ය. 3) 'D' ය. 4) 'E' ය.

25. 'අහසින් වැටුණු මිනිස්සු' නාට්‍යය නිර්මාණය කළේ,
1) 'B' ය. 2) 'C' ය. 3) 'D' ය. 4) 'E' ය.

- පහත දැක්වෙන වෙස් මුහුණු දෙක ආශ්‍රයෙන් 26 සහ 27 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.


(A)


(B)

26. ඉහත 'A' සහ 'B' වෙස් මුහුණු පිළිබඳ සත්‍ය ප්‍රකාශය වන්නේ,
1) 'A' සන්නි මුහුණකි 'B' කෝලම් මුහුණකි. 2) 'A' කෝලම් මුහුණකි 'B' සන්නි මුහුණකි.
3) 'A' සහ 'B' දෙක ම සන්නි මුහුණු දෙකකි. 4) 'A' සහ 'B' දෙක ම කෝලම් මුහුණු දෙකකි.

27. ඉහත 'A' සහ 'B' වෙස් මුහුණු පිළිවෙළින් දැක්වෙන්නේ,
1) දෙමළ සන්නිය, මුදලි කෝලම 2) මනමේ රජු, ආරච්චි කෝලම
3) දේව සන්නිය, ජස කෝලම 4) ආරච්චි කෝලම, කණ සන්නිය

- **පහත දැක්වෙන තොරතුරු ඇසුරෙන් අංක 28 සිට 32 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| | |
|---|---|
| A - මහා සම්මත රජු | B - පඬුවස්දෙව් රජු |
| C - සංඛපාල රජු | D - විෂ්ණු |
| E - රිද්දි බිසව් | F - සේරමාන් රජු |
| G - රාහු අසුරේන්ද්‍ර | H - රාජමුළු |
| I - මංගර දෙවි | J - දීපංකර බුදුන් |

28. සන්නි යකුමේ උපත් කතාව හා සම්බන්ධ වන්නේ,
1) A සහ G ය. 2) C සහ H ය. 3) F සහ J ය. 4) E සහ I ය.

29. සූනියම් යාගයේ උපත් කතාව හා සම්බන්ධ වන්නේ,
1) A සහ D ය. 2) B සහ H ය. 3) H සහ I ය. 4) C සහ E ය.

30. කෙහොඹා කංකාරියේ උපත් කතාව හා සම්බන්ධ වන්නේ,
1) E සහ F ය. 2) C සහ J ය. 3) D සහ C ය. 4) B සහ G ය.

31. මධු ශාන්තිකර්මවල උපත් කතාව හා සම්බන්ධ වන්නේ,
1) C සහ G ය. 2) E සහ H ය. 3) F සහ I ය. 4) B සහ A ය.

32. රට යකුමේ උපත් කතාව හා සම්බන්ධ වන්නේ,
1) F සහ I ය. 2) E සහ J ය. 3) H සහ J ය. 4) C සහ I ය.

33. සොකරි රංග ශෛලිය හා සම්බන්ධ **නොවන්නේ,**
1) සරල වෙස් මුහුණු භාවිතය ය.
2) පිරිමින් පමණක් රංගනයේ යෙදීම ය.
3) අනුරූපණ මාධ්‍යයෙන් කතාවක් ඉදිරිපත් කිරීම ය.
4) රත්නපුර ආදී ප්‍රදේශවල ප්‍රචලිත වී තිබීම ය.

34. ආලෝක පහනක් **නොවන්නේ** ,
1) අල්ට්‍රා වයලට් ලාම්පු ය.
2) වර්ණ චක්‍රය ය.
3) ධාරාලෝක පහන ය.
4) යොමු පහන ය.

35. ඊ. එෆ්. සී ලුඩොවයික් මහතාගේ නාට්‍ය නිර්මාණයක් **නොවන්නේ,**
1) ද ප්‍රොපෝසල් ය.
2) ද රයිවල්ස් ය.
3) මාර්කෝ මිලියන්ස් ය.
4) ආම්ස් ඇන්ඩ් ද මෑන් ය.

36. විකෘති නාට්‍යයේ මූලික දෘෂ්ටිය වන්නේ ,
1) දෙමාපිය අපේක්ෂාවන් දරුවන්ගෙන් ඉටුකර ගැනීමේදී සිදුවන ඛේදවාචකය පෙන්වීම
2) යොවුන් ප්‍රේමයේ අහිතකර තත්ත්වය පෙන්වීම
3) විවෘත ආර්ථිකය නිසා පවුල හා සමාජය අතර ඇතිවන සට්ටනය පෙන්වීම
4) විෂය සමගාමී ක්‍රියා හේතුවෙන් අධ්‍යාපන කටයුතු අඩාළ වන බව පෙන්වීම

37. ‘පළමු මාසයට කිරි ඉතිරවීම’ යන අරුත මුල් කොට ගත් සංස්කෘතික උත්සවය වන්නේ ,
1. දීපවාලී ය.
2. තෛපොංගල් ය.
3. රාමසාන් ය.
4. සිංහල හින්දු අලුත් අවුරුද්ද ය.

38. දේශීය අභිරූපණ ශිල්පීන් වන්නේ ,
1) මහේන්ද්‍ර පෙරේරා, ලෙස්ටර් ජේම්ස් පීරිස්
2) ශ්‍රියන්ත මෙන්ඩිස්, සැනට් දික්කුඹුර
3) විමල් කුමාර ද කොස්තා, ඩග්ලස් රණසිංහ
4) සාලමන් ෆොන්සේකා, ජයන්තා රණවක

39. නාට්‍ය දර්ශනයක් රංග ගත කරන අතරතුර මූලික වගකීම දරන්නා වන්නේ ,
1) අධ්‍යක්ෂවරයා ය.
2) අර්ථපතිවරයා ය.
3) රංග භූමි පාලකයා ය.
4) වේදිකා පසුතල නිර්මාණ ශිල්පියා ය.

40. ‘නාට්‍ය ප්‍රවේශය’ කෘතිය රචනා කරන ලද්දේ,
1) රංජිත් ධර්මකීර්ති ය.
2) ස්ටැනිස්ලව්ස්කි ය.
3) සුගතපාල ද සිල්වා ය.
4) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර ය.

*****

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education, Sri Lanka

| 50 | S | I, II |
|---|---|---|

| | |
|---|---|
| නාට්‍ය හා රංග කලාව | I, II |
| நாடகமும் அரங்கியவும் | I, II |
| Drama & Theatre | I, II |

**අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2022 (2023)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை- ஆதரவு கருத்தரங்கு தொடர்- 2022 (2023)**
**G. C. E. Ordinary Level Examination - Support Seminar Series - 2022 (2023)**

**නාට්‍ය හා රංග කලාව (සිංහල) II**

- පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න

01) දික්තල කාලගෝල නාට්‍යය ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

I. මෙහි මුල් නිර්මාණකරුවාගේ වෙනත් නාට්‍ය දෙකක් නම් කරන්න. (ලකුණු.02)

II. මෙම නාට්‍යයේ ආලෝකකරණය භාවිත කළ විශේෂ අවස්ථාවක් නම් කරන්න. (ලකුණු.02)

III. මෙම නාට්‍යයේ දක්නට ලැබෙන නාඩගම් සම්ප්‍රදායේ ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු.02)

IV. මෙම නාට්‍ය මුල්වරට වේදිකාගත වූ වර්ෂය සහ ස්ථානය නම් කරන්න. (ලකුණු.02)

V. කාලගෝල චරිතය නිරූපණය කළ ශිල්පීන් දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු.02)

VI. 'සොබනා ගඟේ ගං ඉවුරේ පැලක ඉඳ - හඬනා කඳුළු ගඟ පහළින් ගියේ කිමද ' මෙම කවිය ගායනා කරන ලද පාත්‍රයා නම් කරන්න. (ලකුණු.02)

02) (i) රංග වින්‍යාසය යනු කුමක් ද? (ලකුණු.02)

(ii) මෙරට ප්‍රසිද්ධ රංග වින්‍යාස ශිල්පීන් දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු.04)

(iii) රංග වින්‍යාසයේ දී සැලකිලිමත් විය යුතු කරුණු මොනවාදැ යි පැහැදිලි කරන්න. (ලකුණු.06)

03) (i) ප්‍රාසංගික කලා යනු කුමක් දැ යි පැහැදිලි කරන්න. (ලකුණු.02)

(ii) ප්‍රාසංගික කලාවේ අන්තර් ගත විය යුතු සුවිශේෂී ලක්ෂණ හතරක් නම් කරන්න. (ලකුණු.04)

(iii) ඉහත ඔබ නම් කළ සුවිශේෂී ලක්ෂණ ඔපෙරා නාට්‍ය කලාවෙහි භාවිත වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු.06)

04) (i) කාන්තාවන් සඳහාම පහත රට ප්‍රදේශවල සිදුකරන ශාන්ති කර්මය නම් කරන්න. (ලකුණු.02)

(ii) එහි අන්තර් රංග අවස්ථා දෙකක් නම් කරන්න. (ලකුණු.04)

(iii) ඉහත ඔබ සඳහන් කළ එක් අන්තර් රංග අවස්ථාවක නාට්‍යමය ලක්ෂණ උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු.06)

05) (i) කෙටි නාට්‍ය යනු කුමක්දැ යි පැහැදිලි කරන්න. (ලකුණු.02)

(ii) කෙටි නාට්‍යකරුවන් හතර දෙනෙක් නම් කරන්න. (ලකුණු.04)

(iii) කෙටි නාට්‍යයක සුවිශේෂී ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු.06)

06) (i) සුබ සහ යස නාට්‍යය හා කැලණි පාළම නාට්‍යය නිර්මාණය කළ නාට්‍යකරුවන් නම් කරන්න. (ලකුණු.02)

(ii) එම නාට්‍යකරුවන්ගේ වෙනත් නිර්මාණ දෙක බැගින් ලියා දක්වන්න. (ලකුණු.04)

(iii) ඉහත ඔබ සඳහන් කළ එක් නාට්‍යකරුවෙකු තෝරාගෙන ඔහුගෙන් ලාංකේය නාට්‍යය කලාවට ඉටු වූ සේවාව පැහැදිලි කරන්න. (ලකුණු.06)

07) පහත දැක්වෙන කතා සාරාංශය පදනම් කර ගෙන නාට්‍යෝචිත අවස්ථාවක් ගොඩනැගෙන පරිදි නාට්‍ය පෙළක් රචනා කරන්න. ඔබට කැමති පරිදි චරිතවල පුද්ගල නාම, ස්ත්‍රී පුරුෂ බව හෝ චරිත සංඛ්‍යාව වෙනස් කර ගත හැකි ය.

සිරිල් තම නිවසින් බැහැර වන්නේ නිවසට අවශ්‍ය කරන බඩු බාහිරාදිය කිහිපයක් මිල දී ගැනීමේ අදහසිනි. මේ වෙලාව එළියට බැස යාමට සුදුසු වේලාවක් නොවන බව හැඟුණ ද , බිරිඳගේ බල කිරීම නිසා ම නිවසින් පිටතට පැමිණි විට ම දුටු දර්ශනයෙන් දැස් අදහාගත නොහැකි විය.............

(i) පසුබිම, කාලය හා චරිත මැවීමට අවශ්‍ය පරිදි රංග විධාන සමග සංවාද රචනා කිරීම සඳහා (ලකුණු.04)

(ii) චරිත අතර ගැටුමක් ඇතිවන අයුරින් අවස්ථාව ගොඩ නැගීම සඳහා (ලකුණු.04)

(iii) කුතුහලය සහ චරිතයක නොසිතූ පෙරළියක් සහිත නාට්‍යෝචිත අවස්ථාවක් නිර්මාණය කිරීම සඳහා (ලකුණු.04)

*****